# ලංසු සඳහා ආරාධනයයි

# පවිත්‍රතා සේවා සැපයීම

# අග්‍රාමාත්‍ය කාර්යාලය

## ප්‍රසම්පාදන අංක : PMO/PMD/02/01/15/18

1. අග්‍රාමාත්‍ය කාර්යාලය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් දෙවසරක කාලයක් සඳහා අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රයේ පවිත්‍රතා සේවා සැපයීම පිණිස මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. රජයේ හෝ පුද්ගලික අංශයේ ආයතන සඳහා පවිත්‍රතා සේවා සපයනු ලබන හා 250 කට වැඩි සේවක සංඛ්‍යාවක් සේවය කරනු ලබන ලංසුකරුවන් පවිත්‍රතා සේවා සැපයීම සඳහා සුදුසුකම් ලබති.

3. ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

4. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 9,000.00 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගිණුම් අංශය වෙත ගෙවීමෙන් හා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී/ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල **2025 අප්‍රේල් 07 දින දක්වා, පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ** උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

5. සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අග්‍රාමාත්‍ය කාර්යාලය, අංක 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07 යන ලිපිනයට මුද්‍රා තැබූ ලංසු **2025 අප්‍රේල් 08 දින ප.ව. 2.00** ට පෙර ලැබීමට සැළැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ඉහත සඳහන් ලිපිනයේ දී පැමිණ සිටින ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

6. ලංසු සමඟ, ලංසු ලේඛනයන්හි විස්තර සඳහන් පරිදි වූ රුපියල් 400,000.00 (හාර ලක්ෂයක) වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් තිබිය යුතුය.

7. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන් හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 07, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ අංක 58, අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී වෙතින් ලබාගත හැක.

**දුරකථන : 011 257 5317 -18 දිගුව 182-334 /ෆැක්ස් : 011 257 4411**

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**අග්‍රාමාත්‍ය කාර්යාලය,**
**අංක 58 , ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.**
**දිනය : 2025.03.17**